# සිපිරි මාලය කාව්‍ය කෘතියෙන් හෙළිවන ආහාර රටාවන් හා බැඳි දඬුවම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

**කාංචනමාලි එස්.ඒ.එස්.**[1]

දහම් ගැට මාලය සිංහල මාල කවි සාහිත්‍යයේ විද්‍යමාන පළමු මාල කාව්‍ය කෘතියයි . පසු කාලීන ව මෙම මාල කවි සාහිත්‍ය ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට පත් විය එයට අයත් වන කෘතියක් ලෙස සිපිරි මාලය කෘතිය හැඳින්විය හැකිය . මෙම කෘතිය ඒ . ආර් . පී . ජේම්ස් අප්පුහාමි නම් රචකයෙකුගේ කෘතියකි . මෙහි කවි 95 ක් පමණ අන්තර්ගත වේ . මෙයට පදනම් වී ඇත්තේ සිපිරි ගෙයක දඬුවම් විඳින සිරකරුවෙක් තම අද්දැකීම් පදනම් කර ගනිමින් සිදු කරන ලද කාව්‍ය නිර්මාණයකි . සිපිරි ගෙයෙහි ඇඳුම්පැළඳුම් ආහාර රටාවන් ගතිපැවතුම් , තනතුරු , ගෘහ නිර්මාණ ආදී තොරතුරු මෙහි අන්තර්ගත වේ . සිපිරි ගෙයෙහි ගෘහ නිර්මාණයෙන් ආරම්භ වී ක්‍රමයෙන් සියලු අංශ වෙත අවධානය යොමු වන ආකාරයෙන් කාව්‍ය රචනා කර තිබේ . ඒ අනුව , මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සිපිරි සංස්කෘතියේ ආහාර රටාවන් හා බැඳි දඬුවම් ක්‍රම පිළිබඳ විමසා බැලීමයි . මෙම අධ්‍යයනයේ ගැටලුව වන්නේ සමකාලීන සිපිරි සංකෘතියේ ආහාර රටාවන් , දඬුවම් ක්‍රම සමඟ පවත්නා සම්බන්ධය කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීමයි . මෙය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදු කරන ලද අධ්‍යයනයකි . කාව්‍ය ආරම්භයේ දී ඉංග්‍රීසි ජාතිකයන් විසින් ආරම්භ කළ සිර මැදිරි දෙකක් පිළිබඳ සඳහන් කරන රචකයා මෙම කාව්‍යයට පාදක වන්නේ බෝගම්බර බන්ධනාගාරය බව ද සඳහන් කර තිබේ . කවි අධ්‍යයනයේ දී සිර කරුවන් කාණ්ඩ හතරක් සිටි බව නිගමනය කළ හැකිය . එනම් , සාමාන්‍ය සිරකරුවන් , සැහැල්ලු වැඩ ඇති සිරකරුවන් , බරපතල සිරකරුවන් , රෝගී සිරකරුවන් ලෙසයි . බරපතල වැඩ සහිත සිරකරුවන්හට ලුණු සහ බත් දෛනික ආහාර වේල සඳහා නිර්දේශ කර තිබේ . සිරකරුවන් නිරන්තරයෙන් ගල් කැඩීම සඳහා යොමු කර තිබෙන අතර එම කාර්යයේ ප්‍රමිතිය පරීක්ෂා කර බලා තීරණය කරයි . එය නිසි පරිදි ඉටු කර නොමැති නම් ආහාර අඩු කරමින් ලුණු සහ බත් පමණක් දින තුනක් ලබා දේ . දඬුවම් ලෙස ආහාර අඩුවෙන් බලා දීම සහ ඒ සඳහා දින නියම කිරීම ද දක්නට ලැබේ . ආහාර ලබා දීමේ දී විවිධ ආකාරයේ වර්ගීකරණ දක්නට ලැබේ . ලුණු සහ බත් ලබා දීම මස් මාළු සහිත සහ මස් මාළු රහිත ආහාර රටාවන් ය . ආහාර මිනිසාගේ ප්‍රධාන ම අවශ්‍යතාවක් වන බැවින් මෙවැනි උපක්‍රම භාවිත කිරීමෙන් සමකාලීන සමාජයේ මිනිසා වරදින් මුදවා ගැනීමට අපේක්ෂා කරන්නට ඇති බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** ආහාර රටා , දඬුවම් ක්‍රම , මාල කාව්‍යය , සිපිරි මාලය , සිපිරි සංස්කෘතිය

[1]රුහුණ විශ්වවිද්‍යාලය. sandyakanchanamali@gmail.com